**සෞඛ්‍ය අමාත්‍යාංශය**

Ministry of Health

The Global Fund

**ප්‍රදානය - ගෝලීය අරමුදල**

# HIV සංරචකය (LKA-H-MoH)

# හදිසි ඇබෑර්තු

ගෝලීය අරමුදල විසින්, 2019 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාලය සඳහා, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ප්‍රධාන ග්‍රාහක ලෙස ඇමරිකන් ඩොලර් මිලියන 8.7 වටිනා ප්‍රදාන 3 ක් ලබාදී ඇත. මෙම ප්‍රදානය HIV සහ ක්ෂය රෝගය නිවාරණ කටයුතුවල (ව්‍යාපෘති සහාය තුළින්) හා මැලේරියාව ශ්‍රී ලංකාවේ නැවත බිහි වීම වැළැක්වීමේ කටයුතුවල (අයවැය සහායෙන්) යෙදෙනු ලබයි.

අදාළ HIV ප්‍රදානය, එම රෝගයෙන් පීඩා විඳීමේ ඉහළ සම්භාවිතාවකට ගොදුරු විය හැකි අයවලුන් වෙත සහාය වනු පිණිස වේ. ඉන් එක් වැඩසටහනක් වනුයේ මත්ද්‍රව්‍ය භාවිතා කරනු ලබන/ නික්ෂේපණය කරගනු ලබන අයවලුන් සඳහා වන පරිපූර්ණ HIV නිවාරණ වැඩසටහනයි. මෙම වැළැක්වීමේ වැඩසටහනට සහාය දැක්වීම සඳහා සුදුසුකම්ලත් සහ පළපුරුදු පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තෝරාගත් අයදුම්කරු, ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහනේ අධ්‍යක්ෂක / ව්‍යාපෘති කළමනාකරු - HIV සංරචකය යන අය යටතේ රාජකාරි කරනු ලබනවා ඇත. මෙම තනතුර කොළඹ 10, මෙහි හවුස්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයෙහි ස්ථානගත වේ.

## "හෙද" තනතුර -

### මත්ද්‍රව්‍ය භාවිත වැඩසටහන; HIV සංරචකය - ගෝලීය අරමුදල් ප්‍රදානය

### කොන්ත්‍රාත් පදනමින් - තනතුරු 01

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016, සේවා කේතය : MT7 - III ශ්‍රේණිය)

අදාළ හෙද / හෙදිය, මාණ්ඩලික හෙද / හෙදිය ලෙස කටයුතු කළ යුතු අතර, බාහිර විනිවිදුම් සේවාවලට අදාළ සායන රාජකාරි මෙන්ම පරිපාලන රාජකාරි ද පවත්වා ගත යුතුය.

**සේවා කටයුතු හා වගකීම් :**

01. මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන/ නික්ෂේපණය කරගනු ලබන අයවලුන් සඳහා වැඩසටහන් සම්පාදනය කිරීම.
02. ප්‍රජාව තුළ සායන සංවිධානය කිරීම.
03. ප්‍රධාන සලකුණු පරීක්ෂා කිරීම, රුධිර පීඩනය පරීක්ෂා කිරීම, උෂ්ණත්වය හා නාඩි ස්පන්දනය පරීක්ෂා කිරීම.
04. විස්තෘත පරීක්ෂණ සඳහා රුධිර නියැදි එක් රැස් කිරීම.
05. වාර පරීක්ෂා කිරීම සඳහා අවශ්‍යවන පරීක්ෂා කිරීම හා වෛද්‍ය පරීක්ෂණ සඳහා රෝගීන් සූදානම් කිරීම.
06. සරල වෛද්‍ය හදිසි අවස්ථා කළමනාකරණය.
07. සනාථ ලේඛනවල වලංගුභාවය, ප්‍රත්‍යක්ෂ කරනු පිණිස අදාළ වාර්තා පරීක්ෂා කොට සත්‍යාපනය කිරීම හා අවශ්‍යතා පරිදි රෝගියා හඳුනාගැනීම හා අදාළ තොරතුරු ලේඛන ගත කිරීම.
08. වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් සම්බන්ධීකරණය කිරීම හා අදාළ තොග අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූල ද යන්න සහතික කිරීම.
09. වෛද්‍ය වාර්තා පවත්වා ගැනීම හා වෛද්‍ය සේවාවන්හි සංඛ්‍යාන සකස් කිරීම.
10. පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

**අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද හා නිපුණතාවයන් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් හෙද උපාධියක් හෝ රජයේ හෙද විද්‍යාලේ හෙද සහතිකය සමග රාජ්‍ය අංශයේ රෝහල්වල, විශේෂයෙන් මහජන සෞඛ්‍ය/ ව්‍යවස්ථාපිත සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වසර 03 ක සාමාන්‍ය හෙද පළපුරුද්ද සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හෙදියක ලෙස ලියාපදිංචිය.
02. සියලුම උපකරණ ආරක්ෂිත ලෙස හසුරුවනු කටයුතු සම්බන්ධව කාර්ය පළපුරුද්ද.
03. ස්වයං උද්යෝගී, ක්‍රියාශීලී, ප්‍රතිඵල දිශානතිගත, ධෛර්ය සම්පන්න හා ප්‍රගාමී අයෙකු විය යුතුය.
04. වගකීම් හා අභියෝග භාරගැනීමට සූදානම් තිබිය යුතුය.
05. මිත්‍රශීලී බවින් යුතු විය යුතු අතර, ඉතා ඉහළ මානුෂික භාවයෙන් යුතුව පාරිතෝෂික සත්කාරකත්වය සම්බන්ධව කැමැත්තක් තිබිය යුතුය.
06. හෙද සත්කාරකත්වය සම්බන්ධව ඉතා ඉහළ ප්‍රමිතියක් පවත්වා ගැනීම සම්බන්ධව තත්ත්ව පාලන කැමැත්තක් සලකුණු යුතුය.
07. බහු විෂයක කණ්ඩායමක් සමග හා ඒ ඇතුළත සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කිරීමට හැකිවිය යුතුය.
08. පීඩන අවස්ථාවලදී ඉවසීමෙන් හා සන්සුන් බවින් යුතුව කටයුතු කිරීමට හැකියාව තිබිය යුතුය.
09. ඉතා ඉහළ අන්තර්පුද්ගල හා සන්නිවේදන කුසලතාවලින් හෙබි විය යුතුය.
10. පරිගණක සාක්ෂරතාවයෙන් යුක්ත විය යුතුය.
11. අවශ්‍යතාවය පරිදි නියමිත කාලරාමුවෙන් පිටස්තරව සේවය කිරීමට ඇති කැමැත්ත තිබිය යුතුය.

**පොදු කොන්දේසි :**

1. රාජකාරි ස්ථානය කොළඹ වන අතර, එහෙත් දිවයින පුරා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ස්ථාන වෙත යෑමට අවශ්‍ය විය හැකිය.
2. වයස 2020-12-31 දිනට අවුරුදු 64 ට අඩු විය යුතුය.
3. බඳවා ගැනීම කොන්ත්‍රාත් පදනමින් සිදු කෙරේ.
4. අදාළ පළමු කොන්ත්‍රාත් කාලය 2020 දෙසැම්බර් 31 දින දක්වා වන අතර, එයින් පළමු මාස තුන පරිවාස කාලයකට යටත් වනු ඇත.
5. වැටුප, 2016-02-25 දිනැති අංක 03/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ MT 7-2016, III ශ්‍රේණිය ප්‍රකාරව වන අතර, රජය මඟින් අනුමත කළ ජීවන වියදම් දීමනාවද ගෙවනු ලැබේ. (රුපියල් 32,525.00*1.5+රුපියල් 7,800.00 = රුපියල් 56,587.50)
6. සේවායා විසින් සේවකයාගේ වැටුපෙන් 12% ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලටත්, 3% ප්‍රමාණයක් සේවක භාර අරමුදලටත් ලෙස දායක වනු ඇත. සේවක අර්ථසාධක අරමුදල වෙත සේවකයාගේ දායකත්වය වැටුපෙන් 8% කි.
7. තෝරා ගත් අයදුම්කරු, වහාම ක්‍රියාත්මකවන පරිදි, විශේෂයෙන් මසකට නොවැඩි කාලයක් තුළදී, මෙම තනතුරට පත්වීමට සූදානම්ව සිටිය යුතුය.
8. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානී / ප්‍රධාන විධායක නිලධාරී මාර්ගයෙන් තම අයදුම්පත් යොමු කළ යුතු අතර, එම නිලධාරියා විසින්, අයදුම්කරු මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත්, දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන්න සඳහන් කළ යුතුය.
9. කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**සියලුම අයදුම්පත්, පිටපත් ඇතුළත්ව සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය සියලුම සහතික / ලේඛනවල පිටපත් සමග (අත්‍යවශ්‍යයි)** තැපැල් මාර්ගයෙන් හෝ ඊමේල් මාර්ගයෙන් ලැබීමට සැලැස්විය යුතුය. එසේ නොවන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ "'හෙද' තනතුර සඳහා අයදුම්පත - මත්ද්‍රව්‍ය භාවිත වැඩසටහන, HIV සංරචකය, ගෝලීය අරමුදලේ ප්‍රදානය"**, ලෙසට සඳහන් කොට පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2020 නොවැම්බර් 08**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - ගෝලීය අරමුදල් ව්‍යාපෘතිය,**
**03 වන මහල, මහජන සෞඛ්‍ය සංකීර්ණය,**
**අංක 555/5, ඇල්විටිගල මාවත,**
**කොළඹ 05.**

**ඊමේල් :** vacancygfatm@gmail.com / **දුරකථන : 0112-581918/ෆැක්ස් : 0112-368885.**

Source: Silumina, Sunday Observer (2020.10.25)